රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 09/2006

මගේ අංකය : ආ/7/5/4/11
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ
කටයුතු අමාත්‍යාංශය
නිදහස් චතුරස්‍රය
කොළඹ 07
2006.05.30

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

## රාජ්‍ය නිලධාරීන්ගේ කාර්යාල වේලාවන්

**2006.06.19** දින සිට ක්‍රියාත්මක වන පරිදි රජයේ සේවාවන්හි නියුතු කණිෂ්ඨ සේවකයින් හැර අනෙකුත් සියළුම සේවකයින්ගේ කාර්යාල වේලාව (දිවා භෝජනය සඳහා විනාඩි **30** ක කාලය සමඟ) පෙ.ව. **8.30** සිට ප.ව. **4.15** දක්වා විය යුතු බව රජය තීරණය කර ඇත. මුදල් ගනුදෙනු කටයුතු සඳහා රජයේ සියළුම කාර්යාල වැඩ කරන දිනයන්හි පස්වරු **3.00** දක්වා ඉඩකඩ සහ පහසුකම් සැලසිය යුතුය.

**02.** රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ **162** හි සඳහන් පරිදි කණිෂ්ඨ සේවකයින් සඳහා විනාඩි **30** ක දිවා භෝජන කාලවේලාවද සමඟ කාර්යාල වේලාව පෙ.ව. **8.00** සිට ප.ව. **4.45** දක්වා වේ.

**03.** ප්‍රමාදවී පැමිණෙන නිලධාරීන් සඳහා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක **3/92** හා **6/94** මගින් ලබාදුන් සහනයන් ඉහත දක්වන ලද නව කාර්යාල වේලාවන්ට අනුරූපීව සංශෝධනය වන බව සැලකිය යුතුය.

**04. 2006.06.19** දින සිට පැසැල් වේලාව පෙ.ව. **7.30** සිට ප.ව. **1.30** වශයෙන් සංශෝධනය විය යුතු බවටද රජය තීරණය කර ඇත. එකී සංශෝධනය අනුව වැඩිදුර උපදෙස් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් විසින් නිකුත් කරනු ඇත.

**05.** ඉහත කාර්යාල සහ පාසැල් වේලාවන් වෙනස්වීමට අනුරූපී වන ආකාරයෙන් බස් හා දුම්රිය සේවාවන් ආරම්භ කරනු ලබන වේලාවන් දුම්රිය හා ගමනා ගමන අමාත්‍යාංශයේ ලේකම් විසින් සංශෝධනය කරනු ඇත.

ඩී.දිසානායක
ලේකම්
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය